# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1945/8 - 2015 දෙසැම්බර් මස 15 වැනි අඟහරුවාදා - 2015.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 982 දරන සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 25 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, මුදල් අමාත්‍ය, රවි කරුණානායක වන මම, 2015 දෙසැම්බර් මස 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් නියමය ප්‍රකාශයට පත් කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**නියමය**

(1) වෙනත් කිසිම නිවේදනයක මීට පටහැනිව කවරක් සඳහන් කර තිබුන ද, ඒ බව නොසලකා බලපත්‍රලත් නිෂ්පාදනාගාරයකින් නිකුත් කරනු ලබන හෝ ඕනෑම බලපත්‍ර ස්ථානයක සිල්ලර විකිණීම සඳහා ඇති විශේෂ අරක්කු, තල් අරක්කු, ඉක්ෂුපාක අරක්කු, පොල් අරක්කු සහ පදම් කළ අරක්කු වල සැර ප්‍රමාණය ඒ ඒ නිෂ්පාදන සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන සැර ප්‍රමාණයක්ම විය යුතු අතර නිෂ්පාදකයා විසින් ලේබලයේ දක්වා ඇති අනුමත නිරපේක්ෂක සැර 20.0%ට නොඅඩු විය යුතු අතර නිරපේක්ෂක සැර 48.5%ට නොවැඩි විය යුතු බව,

(2) දේශීයව නිෂ්පාදනය කරනු ලබන "විදේශීය " මත්පැන් හෝ ආනයනික "විදේශීය" මත්පැන් සඳහා අවම නිරපේක්ෂක සැර ප්‍රමාණය 37.0%ක් විය යුතු අතර උපරිම නිරපේක්ෂක සැර ප්‍රමාණය 50.0%ක් විය යුතු බව

(3) කිරිපොන්සා සඳහා උපරිම නිරපේක්ෂක සැර ප්‍රමාණය 17.1%ක් විය යුතු බව,

(4) වෛද්‍ය වයින් වර්ග සඳහා උපරිම නිරපේක්ෂක සැර ප්‍රමාණය 20.0%ක් විය යුතු බව,

(5) දේශීයව නිෂ්පාදනය කරනු ලබන ධාන්‍ය මත්පැන් හෝ ආනයනික ධාන්‍ය මත්පැන් සඳහා අවම නිරපේක්ෂක සැර ප්‍රමාණය 4.0%ක් විය යුතු අතර උපරිම නිරපේක්ෂක සැර ප්‍රමාණය 8.8%ක් විය යුතුය.

1928.06.01 දිනැති 176 දරන සුරාබදු නිවේදනයේ III කොටසේ (14) වැනි වගන්තිය, 1985.08.13 දිනැති අංක 743 දරන සුරාබදු නිවේදනය සහ 1985.12.16 දිනැති අංක 749 දරන සුරාබදු නිවේදනය මෙයින් පරිච්ඡින්න කරමි.

01-86

1A - PG 2731— 506 (2015/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*